# දියමන්ති ව්‍යාපෘතියට අදාළ සමාජීය විද්‍යා විෂයයන් වල අධ්‍යයන ඉලක්ක.
# (සබරගමු පළාතේ සියලු පාසල් සඳහා)

**පළමුවන අදියර**

**09 ශ්‍රේණිය**

**පළමු වාරය - නර්තනය**

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **01** | 1.0 පරිසර නිරීක්ෂණයෙන් ලැබෙන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණය කරයි. | 1.1 පරිසරයේ දක්නට ලැබෙන මිනිස් චරිත ඇසුරින් නර්තන නිර්මාණ කරයි. | 1.1<br>* පරිසරයේ දක්නට ලැබෙන මිනිස් චරිත (ධීවරයා, ගොවියා) පිළිබඳ සාකච්ඡා කිරීම සහ සිසුන් ලබා ඇති අත්දැකීම් විමසීම.<br>* දෘශ්‍ය සංයුක්ත තැටි මගින් පාඩමට පිවිසීම.<br>* එම චරිතවලට අදාළ සුවිශේෂී චලන නර්තන මාධ්‍යයෙන් නිර්මාණය කරයි.<br>* සිද්ධියක් ගොඩනගාගෙන ඊට අදාළ චලන සුදුසු වාද්‍ය භාණ්ඩ යොදාගෙන නර්තන නිර්මාණයට යොමු කිරීම.<br>* ඒකල හා කණ්ඩායම් ලෙස ඉදිරිපත් කිරීම. | 02<br>පැය 01 වි. 20<br><br>01<br>වි. 40 | ජනවාරි 01 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **02** | 1.0 පරිසරය නිරීක්ෂණයෙන් ලැබෙන අත්දැකීම් ඇසුරුකර ගනිමින් නර්තනය නිර්මාණය කරයි. | 1.1 පරිසරයේ දක්නට ලැබෙන මිනිස් චරිත ඇසුරින් නර්තන නිර්මාණ කරයි. | 1.1 පරිසරයේ දක්නට ලැබෙන මිනිස් චරිත (කුඹල් කරු, තේ දළු නෙළන්නී) පිළිබඳ සාකච්ඡා කිරීම.<br>* දෘශ්‍ය සංයුක්ත තැටි මගින් නැරඹීම.<br>* සුදුසු සිද්ධියක් ගොඩනගාගෙන එයට අදාළ චලන විවිධ වාද්‍ය භාණ්ඩවල වාදනයට අදාළව නර්තන නිර්මාණය කිරීම.<br>* කේවල හා කණ්ඩායම් ඉදිරිපත් කිරීමට යොමුකිරීම. | 01<br>වි. 40<br><br>02<br>පැය 01 වි. 20 | ජනවාරි 02 සතිය<br><br>ජනවාරි 02 සතිය |
| **03** | 2.0 නර්තනය හා සබැඳි මූල ධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.2 පාද නිවැරදිව හැසිරවීම සඳහා මූලික සරඹ ඉදිරිපත් කරයි. | * පාද තාල තබමින් කියයි.<br>* පළමු පා සරඹයේ සිට නවවන පා සරඹය දක්වා අභ්‍යාස කරවීම.<br>* 10 – 11 – 12 පා සරඹ නිවැරදි අංගහාර අනුව නර්තනයට යොමුකිරීම සමගුණ, දෙගුණ ඇසුරින් නර්තනයේ යෙදීම.<br>* තාලාවබෝධයෙන් යුතුව පා සරඹ ඉදිරිපත් කිරීමට යොමු කිරීම.<br>* හමාර පදය ඉදිරිපත් කිරීම. | 01<br>වි. 40<br><br>02<br>පැය 01 වි. 20 | ජනවාරි 03 සතිය<br><br>ජනවාරි 03 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **04** | 2.0 නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.2 නර්තනය හා සබැඳි විධික්‍රම අනුගමනය කරමින් සරඹ ඉදිරිපත් කරයි. | **2.2** ගොඩ සරඹ / ඉලංගම් සරඹ / දොඹින පද අභ්‍යාසයෙන් සම්ප්‍රදායික නර්තනයට හස්ත පාද හුරු කර ගනිමු.<br>1 සිට 6 දක්වා ගොඩසරඹ / ඉලංගම් සරඹ / දොඹින පද මතකයට නංවමින් අභ්‍යාස කිරිම. (7,8,9)<br>* පද තාල තබමින් කියයි.<br>* අංගහාර අනුගමනය කරමින් අත් සහ පාද නිවැරදි ලෙස අභ්‍යාස කිරීමට යොමු කිරීම.<br>කස්තිරම / ඉරට්ටිය/ හමාර පදය තාල තබමින් කියයි.<br>අංගහාරවල සුවිශේෂ අවස්ථා ඉස්මතු කරමින් බෙර වාදනයට අනුව පද කස්තිරම් අභ්‍යාස කිරීමට යොමු කිරීම.<br>* බෙරවාදනයට අනුව 1 සිට 9 වන සරඹ දක්වා නිවැරදි අංගහාර සහිතව අභ්‍යාසයේ යෙදීම. | 01<br>වි. 40<br><br>02<br>පැය 01 වි. 20<br><br>02<br>පැය 01 වි. 20<br><br>01<br>වි. 40 | ජනවාරි 04 සතිය<br><br>ජනවාරි 04 සතිය<br><br>ජනවාරි 05 සතිය<br><br>පෙබරවාරි 01 සතිය |
| **05** | | | 7, 8, 9 සරඹ ඇගයීම | 01<br>පැය 01 වි. 20 | පෙබරවාරි 01 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **06** | 2.0 නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | සාම්ප්‍රදායික නර්තන ඇසුරින් අලංකාර පද නිර්මාණය කරයි. | **2.3** අලංකාර පද නිර්මාණය මගින් රස විඳිමු.<br>අලංකාර පද සඳහා සුදුසු චලන නිර්මාණයට මග පෙන්වීම.<br>විවිධ පද චලන අලංකාර ලෙස අදාල අවස්ථාවන්ට ගැලපෙන සේ නිර්මාණය කිරීම<br>වාදනයට අනුව පද නර්තනයේ යෙදීම.<br>ඇගයීම | 02<br>පැය 01 වි. 20<br>01<br>වි. 40<br>01<br>වි. 40 | පෙබරවාරි 02 සතිය<br>පෙබරවාරි 03 සතිය |
| **07** | 4.0 ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනවල පසුබිම අධ්‍යනය කරයි. | 4.0 නිර්දේශිත ගායනාවල සමාජයීය හා සංස්කෘතික පසුබිම විස්තර කරයි. | 4.1 කඩතුරා කවි පන්නෙලීම ගොයම්, සොකරි නියමිත වන්නම් ගායනාවල සංස්කෘතික පසුබිම හා ගායනාවල සුවිශේෂ ලක්ෂණ<br>* මෙම ගායනා හා එම ගායනා භාවිත අවස්ථා සාකච්ඡා කිරීම.<br>* ගායනා කිහිපයක් ශ්‍රවණයට සැලැස්වීම<br>* ශ්‍රැතියට ගායනා කිරීමේ වැදගත්කම සහ සම්ප්‍රධායන්ට අදාලව වෙනත් නාදමාලාවන් ඇතිබව දැනුවත් කිරීම.<br>* ගායනාවලට උචිත ක්‍රියාකාරකම් වල යෙදීම. | 01<br>වි. 40<br>02<br>පැය 01 වි. 20 | පෙබරවාරි 03 සතිය<br>මාර්තු 01 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **08** | 8.0 නර්තන කලාවෙන් ලැබෙන මානසික හා ශාරීරික ස්වස්ථතාව සාර්ථක දිවිපෙවෙතක් ගත කිරීමට ඉවහල් කර ගනියි. | 8.1 ශාරීරික ස්වස්ථතාව පවත්වා ගැනීමේ වටිනාකම විස්තර කරයි. | **8.1** ශාරීරික ස්වස්ථතාව පවත්වා ගනිමු.<br>සිසුන්ලවා නර්තනයක් ඉදිරිපත් කිරීම<br>* නර්තනයේදී ශරීරයේ ඇතිවන වෙනස්කම් සාකච්ඡා කිරීම.<br>* නර්තනයේ වේගය හා රිද්මය පවත්වා ගැනීම හා ශාරීරික අවයව පවත්වා ගැනීම හා ශාරීරික අවයව පවත්වා ගන්නා ආකාරය සාකච්ඡා කිරීම.<br>* ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නිරත වීමේ වටිනාකම දැනුවත් කිරීම.<br>* කෙටි මාතෘකා යටතේ ඉදිරිපත් කිරීම.<br>* ඉදිරිපත් කරන ලද කරන ඇගයීම. | 02<br>පැය 01 වි. 20<br><br>02<br>පැය 01 වි. 20 | මාර්තු 01 සතිය<br>මාර්තු 02 සතිය<br><br>මාර්තු 02 සතිය<br>මාර්තු 03 සතිය<br>මාර්තු 04 සතිය |
| **09** | 3.0 සම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 3.1 සම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | **3.1** ගැටබෙරය හා එහි වාදන අවස්ථා පිළිබඳ තොරතුරු විමසමු.<br>* ගැටබෙරය පිළිබඳ හොඳින් අධ්‍යයනය කිරීමට අවස්ථාව ලබා<br>එහි ව්‍යුහය පිළිබඳ දැනුවත් කිරීම.<br>සිසුන්ට බෙරය පරිහණයට අවස්ථාව ලබා දී එහි කොටස් පිළිබඳ සාකච්ඡා කිරීම.<br>යොදා ගන්නා අමුද්‍රව්‍ය නම් කිරීම. | 02<br>පැය 01 වි. 20 | මාර්තු 04 සතිය |
| **10** | | | ප්‍රායෝගික පරීක්ෂණ සඳහා කාලය වෙන් කිරීම.<br>ප්‍රායෝගික පුහුණුවීම් | 07 | මාර්තු 04 සතිය<br>මාර්තු 05 සතිය |

# දියමන්ති ව්‍යාපෘතියට අදාළ සමාජීය විද්‍යා විෂයයන් වල අධ්‍යයන ඉලක්ක.

## (සබරගමු පළාතේ සියලු පාසල් සඳහා)

**පළමුවන අදියර**

**07 ශ්‍රේණිය**

**දෙවන වාරය - නර්තනය**

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **01** | 1.0 පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණය කරයි. | 1.3 ගැමි නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනාගනිමින් නර්තන නිර්මාණ කරයි. | 1.3 පත් නෙළීම / ගොයම් කැපීමේ නැටුමක් නිර්මාණය කරයි.<br>මේ හා සම්බන්ධ නැටුමක් නැරඹීමට අවස්ථාව ලබා දීම.<br>තාල තබමින් කවි ගායනා කර පෙන්වීම<br>සිසුන්ට එම කවි ගායනයට අවස්ථාව ලබා දීම.<br>අදාළ උපකරණ භාවිතා කරන ආකාරය පෙන්වාදීම.<br>ළමුන් එම උපකරණ හසුරුවන අයුරු නිරීක්ෂණය කිරීම.<br>සිසු නිර්මාණයන්ට අවස්ථාව ලබා දීම.<br>* නර්තන නිර්මාණවල ගායනය චලනවල උචිත බව, උපකරණ හැසිරවීම. අවකාශ භාවිතය, රංග රටා සාමූහික බව, නිර්මාණාත්මක බව, සමස්ත නිමාව පිළිබඳ විචාරාත්මකව අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම සහ සමාලෝචනය. | 02<br>පැය 01 වි. 20<br><br>01<br>වි. 40 | අප්‍රේල් 4 සතිය<br><br>අප්‍රේල් 4 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **02** | 1.0 පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණය කරයි. | 1.3 ගැමි නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනාගනිමින් නර්තන නිර්මාණ කරයි. | 1.3 පත් නෙළීම / ගොයම් කැපීමේ නැටුමක් නිර්මාණය කරයි.<br>* මේ හා සම්බන්ධ නැටුමක් නැරඹීමට අවස්ථාව ලබා දීම.<br>* අදාළ උපකරණය හසුරුවන අයුරු පෙන්වා දීම හා ඒ සඳහා උදව් දීම.<br>* සිසුන් කණ්ඩායම් කර උචිත පද නිර්මාණයට අවස්ථාව ලබා දීම.<br>* එම පදවල උචිත අනුචිත බව නිරීක්ෂණය කර බැලීම.<br>* දුර්වලතා අවබෝධ කරදීම.<br>* අවකාශය රංග රටා, ඇතුලත් කර නිර්මාණය කණ්ඩායම් ලෙස ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම. | 02<br>පැය 01 වි. 20 | මැයි 01 සතිය |
| **03** | සම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය භාණ්ඩ උපකරණ හඳුනා ගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි. | විධික්‍රම අනුගමනය කරමින් බෙර වාදනය කරයි. | සතර බීජාක්ෂර මුල්කර ගනිමින් සරඹ පද වාදනය සහ මැදුම් තනි තිතට අයත් පද වාදනය<br>* බෙර වාදනය සඳහා මූලිකවන සතර බීජාක්ෂර සහ බෙර සරඹ නම් කිරීම.<br>* මැදුම් තනිතිතට අත් බෙර පද නම් කිරීම | 02<br>පැය 01 වි. 20 | මැයි 01 සතිය<br>මැයි 02 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **03** | | | * බෙරපද, බෙර සරඹ තාල තබා කියවීම. (ඒකල සහ කණ්ඩායම් ලෙස)<br>* බෙර පද වාදනයට යොමු කිරීම.<br>* සමගුණ, දෙගුණ, සිව් ගුණ යට අනුව බෙර පද වාදනය කරවීම<br><br>ප්‍රායෝගික අභ්‍යාස | 02<br>වි. 40 | මැයි 02 සතිය |
| **04** | 4.0 ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා බැඳි ගායනාවල සමාජීය හා සංස්කෘතික පසුබිම විස්තර කරයි. | 4.2 නියමිත තිත් රූප හා නාදමාලා අනුගමනය කරමින් ගායනය ඉදිරිපත් කරයි. | 4.2 ගොයම්, සොකරි, සිංහරාජ වන්නම් ශ්‍රවණයට ඉඩ සලස්වයි.<br>* කවි ඇතුළත් ඇමුණුම සිසුන් අතට පත් කිරීම.<br>* සියළුම සිසුන් සමග කවි ගායනය කරවීම.<br>* කණ්ඩායම් වශයෙන් බෙදා පුහුණුවීමට සැලැස්වීම හා අවශ්‍ය උපදෙස් ලබාදීම.<br>* එක් එක් කණ්ඩායම්වල ගායනය ඉදිරිපත් කිරීමට ඉඩ සැලැස්වීම.<br>* ගායනයේදී ප්‍රබලතා, දුබලතා හඳුනාගෙන ප්‍රතිපෝෂණ ක්‍රියාවලියේ යෙදීම.<br>ඇගයීම<br>(කේවල සහ කණ්ඩායම් වශයෙන්) | 02<br>පැය 01 වි. 20<br><br>01<br>වි. 40 | මැයි 03 සතිය<br><br>මැයි 03 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **05** | 2.0 නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.5 නිවැරදි අංගහාර අනුගමනය කරමින් සම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි. | 2.5.1වන්නම් /සින්දු වන්නම් නර්තනය කරමු<br>* 8 ශ්‍රේණියේ උගත් වන්නම අයත් සීරුමාරුව හා අඩව්ව තාල තබා කීම හා ඒ අනුව නර්තනය<br>* 8 ශ්‍රේණියට උගත් වන්නම බෙර වාදනයට අනුව නර්තනයේ යෙදීම.<br>* 9 ශ්‍රේණියට අදාළ වන්නම් / සිංදු වන්නම් තාල රූප හඳුන්වාදී තානම කවිය තාල තබා කිම.<br>ගායනය සමග සුදුසු මාත්‍රා (පද) ගුරුවරයා නර්තනය කිරීම හා සිසුන් නර්තනයට යොමු කිරීම.<br>* බෙර වාදනය අනුව 9 ශ්‍රේණියට අදාල වන්නම් / සින්දු වන්නම් නර්තනය කිරීම.<br>සුදුසු නිර්නායක අනුව වන්නම් ඇගයීම | 02<br>පැය 01 වි. 20<br>01<br>වි. 40<br>02<br>පැය 01 වි. 20<br>01<br>වි. 40 | මැයි 04 සතිය<br>මැයි 04 සතිය<br>ජුනි 01 සතිය<br>ජුනි 01 සතිය |
| **06** | 5.0 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුමය රැකගැනීම සඳහා ක්‍රියා කරයි. | 5.1 ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ඓතිහාසික පසුබිම විස්තර කරයි. | නර්තනය හා සම්බන්ධ මූලාශ්‍ර හඳුනා ගනිමු. (සෙල්ලිපි සංදේශ කාව්‍ය)<br>* නර්තනය හා සම්බන්ධ රූප සටහන් දෘශ්‍ය තැටි ප්‍රදර්ශනය කිරීම.<br>* සංදේශ කාව්‍යවල ඇතුළත් සංදේශ ගායනා කිරීම. | 02 | ජුනි 02 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **06** | | | * ප්‍රදර්ශණය කරන ලද සෙල්ලිපි හා සංදේශ කාව්‍ය අන්තර්ගතය පිළිබඳ පහත කරුණු ඔස්සේ සාකච්ඡා කිරීම.<br>* සෙල්ලිපි දැකිය හැකි ස්ථාන<br>* සෙල්ලිපි හා සංදේශ කාව්‍ය ඇතුළත් යාග<br>* මූලාශ්‍රවලට අදාළ සාධක 2 පන්තියේ සිසුන් කණ්ඩායම් කර කාර්ය පත්‍රිකා වලට අදාළ පොත්පත් බෙදා දීම.<br>* ඒ ඒ කණ්ඩායම් වලට අදාල යාග වලට, අයත් තොරතුරු සෙල්ලිපි සංදේශ කාව්‍ය ඇසුරින් ගොනු කිරීමට යොමු කිරීම. | 01<br>වි. 40 | ජුනි 02 සතිය |
| **07** | 7.0 විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් කලාංග නිර්මාණය කරයි. | 7.3 සරල රංග උපකරණයක් නිර්මාණය කරයි. | රංග උපකරණයක් නිර්මාණය කරවා<br>* කුලු, ගොයම්, මොල්ගස්, නැටුම් ගුරුවරයා හෝ දෘශ්‍යපට මගින් නර්තන අවස්ථා පෙන්වීම.<br>* ගුණාත්මක යෙදුම් සඳහා යොදාගනු ලැබූ උපකරණ පෙන්වා නාමික වශයෙන් හඳුන්වා (සිසු සාකච්ඡා මගින්) ඒවා සාදා ඇති අමුද්‍රව්‍ය පිළිබඳ විමසා පාඩමට පිවිසීම. | 02 | ජුනි 03 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **07** | | | * සිසුන් ප්‍රමාණයට අනුව කණ්ඩායම්කර ඒ ඒ උපකරණ සඳහා පරිසරයෙන් සොයාගත හැකි අමුද්‍රව්‍ය පිළිබඳ සාකච්ඡාවක් කිරීම එහිදී සිසුන්ගේ අදහස් මගින් මේ සඳහා තොරතුරු ලබාගැනීම, අමුද්‍රව්‍ය ලෙස කොළපත්, කාඩ්බෝඩ්, බ්‍රිසිල්බෝඩ්, රෙදි ඔතන බම්බු .... යනාදිය එක්රැස් කිරීමට කාලය ලබාදීම.<br>* ඒ රැස් කරගත් අමුද්‍රව්‍යවලින් උපකරණ සෑදීම සඳහා ආකෘතිය සැකසීමට උපදෙස් ලබාදීම.<br>උදා :- වට ප්‍රමාණය උස දිග<br>* සාදාගත් ආකෘතියට අනුකූලව එක්රැස්කර ගන්නා ලද අමුද්‍රව්‍යවලින් එය සැකසීමට අවස්ථාව ලබාදේ.<br>මේ අවස්ථාවේදී නිරන්තරයෙන්ම කණ්ඩායම් සඳහා ගුරුවරයාගේ අවධානය ලබාගන්න.<br>* උපකරණ සැකසීමෙන් පසු ඒවා සකස් කිරීමේ දී ඇති වූ ගැටළු ලබාගත් අත්දැකීම් නිර්මාණාත්මක බව ආදි හේතු පිළිබඳ සාකච්ඡා වේ.<br>ඇගයීම<br>රංග උපකරණයෙන් නිර්මාණය කිරීම සුදුසු නිර්ණායක යටතේ ඇගයීම කරන්න. | 01<br>වි. 40<br><br>02<br>පැය 01 වි. 20 | ජුනි 03 සතිය<br><br>ජුනි 04 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **08** | 1.0 පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණය කරයි. | 1.2 භාව ප්‍රකාශනය වන පරිදි චරිත නිරූපණය කරයි. | 1.2 ශෝකය නැමති ස්ථායිභාවය නිරූපණය කරමු.<br>* ශෝකය නැමති ස්ථායිභාවය ප්‍රකාශනය වන සංගීත ඛණ්ඩයක් ශ්‍රවණයට සැලැස්වීම.<br>පින්තූර ප්‍රදර්ශනය කිරීම හෝ ආගමික කථා පුවත් / ඉතිහාස කථා පුවත් යොදාගෙන සාකච්ඡා මෙහෙය වීම.<br>1 පියවර<br>ශෝකය නැමති ස්ථායිභාවය ඉස්මතු කලහැකි අවස්ථා හඳුනාගැනීම හා එහි සුවිශේෂී ලක්ෂණ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම.<br>* උදා :- ප්‍රියයන්ගෙන් වෙන්වීම විපත් සිදුවීම.... ආදි<br>* සිසුන් සංඛ්‍යාව අනුව කණ්ඩායම් වලට බෙදා සුදුසු සිද්ධියක් ගොඩනැගීමට යොමු කිරීම.<br>ඇගයීම<br>සටහන් කරන ලද සිද්ධි මගින් එක් නිර්මාණාත්මක සිද්ධියක් තෝරාගෙන සිද්ධියෙහි චරිතවලට අදාළව චලන භාව ප්‍රකාශනය වන පරිදි නිර්මාණාත්මකව කිරීමට අවස්ථාව ලබාදීම.<br>* සිසු නිර්මාණ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදී ඒ පිළිබඳ විචාරාත්මක අදහස හා යෝජනා ඉදිරිපත් කල සමාලෝචනය කිරීම.<br>ඇගයීම<br>වාර පරීක්ෂණ ඇගයීම<br>වාර පරීක්ෂණ ඇගයීම<br>වාර පරීක්ෂණ ඇගයීම | 01<br>වි. 40<br><br>02<br>පැය 01 වි. 20<br><br>01<br>02<br><br>01 | ජුනි 04 සතිය<br><br>ජුනි 05 සතිය<br><br>ජුලි 01 සතිය<br>ජුලි 02 සතිය<br><br>ජුලි 02 සතිය<br>ජුලි 03 සතිය<br>ජුලි 04 සතිය<br>ජුලි 05 සතිය |

## දියමන්ති ව්‍යාපෘතියට අදාළ සමාජීය විද්‍යා විෂයයන් වල අධ්‍යයන ඉලක්ක.
## (සබරගමු පළාතේ සියලු පාසල් සඳහා)

**පළමුවන අදියර**

**07 ශ්‍රේණිය**

**තුන්වන වාරය - නර්තනය**

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **01** | 4.0 ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනවල පසුබිම අධ්‍යයනය කරයි. | 4.2 නියමිත තිත්රූප හා නාදමාලා අනුගමනය කරමින් ගායනය ඉදිරිපත් කරයි. | 4.2 කඩතුරා, පන්නෙලීම, ගොයම්<br>* උගත් ගායනා සියල්ල ගුරුවරයා සමඟ ගායනා කිරීම.<br>* කඩතුරා / පන්නෙලීම / ගොයම් කවි අකුරින් නම් කරන ලද ගායනා කණ්ඩායම් වශයෙන් ගායනා කිරීම ගායනයේ ඇති දුර්වලතා නැවත සැකසීම.<br>* කේවල සහ සාමූහික ලෙස නම් කරන ලද ගායනා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම. | 02<br>පැය 01 වි. 20 | සැප්. 01 සතිය |
| **02** | 3.0 සාම්ප්‍රධායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 3.3 පංචතූර්ය වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | 3.3.1 පංචතූර්ය වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු රැස්කරමු.<br>* පංචතූර්ය වාදන අවස්ථා පිළිබඳ සාකච්ඡා කිරීම.<br>* මෙම වාද්‍ය භාණ්ඩ සිසුන් අතට පත්කර වාදනය කරන ආකාරය හඳුනා ගැනීමට අවස්ථාව ලබාදීම ඒ අනුව වාදනය කරන ආකාරය සාකච්ඡා කිරීම.<br>* ලබා දෙන කාර්ය පත්‍රිකාවට අනුව ලබාදුන් භාණ්ඩ ලේඛණ වර්ගීකර දැක්වීම. | 02<br>පැය 01 වි. 20 | සැප්. 01 සතිය<br>සැප්. 02 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **03** | 2.0 නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.4 විධික්‍රම අනුගමනය කරමින් ප්‍රස්තාර කරයි. | 2.4 බෙර පද වන්නම්, කවි ප්‍රස්තාර කරමු.<br>* ගොයම් කවියක් සාමූහිකව ගයා එය ප්‍රස්තාර කිරීමට යොමු කිරීම.<br>(මාත්‍රා 3 ට අයත්)<br>* ප්‍රස්තාරකරණයේ වැරදි නිවැරදි හඳුන්වාදී ගුරුවරයා සමඟ එම කවිය නැවත ප්‍රස්තාර කිරීම.<br>* ගායනය කරන අතර තාලම්පට වදින අක්ෂරය ලකුණු කර ගැනීම. ඒ අනුව ප්‍රස්තාරයට යොමු කිරීම.<br>* 3 + 4 තාල රූපයට කවිපදයක් ප්‍රස්තාර කර පෙන්වීම.<br>* වැරදි නිවැරදි කරමින් මඟ පෙන්වාදීම.<br>* ළමුන් ලවා බෙරපද, කවි, වන්නම් ප්‍රස්තාර කරවීම.<br>ඇගයීම<br>ප්‍රස්තාර කිරීම - අදාළ තාල රූපවලට අනුව ප්‍රස්තාර කරන්න. | 02<br>පැය 01 වි. 20<br><br>01<br>වි. 40<br><br>01<br>වි. 40 | සැප්. 02 සතිය<br><br>සැප්. 03 සතිය<br><br>සැප්. 03 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **04** | 5.0 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | 5.2 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සැබැඳි තොරතුරු ඉදිරිපත් කරයි. | 5.2 ශාන්තිකර්ම හඳුනා ගනිමු.<br>* අදාළ ශාන්තිකර්ම පැවතීමේ හේතු දක්වයි. (අතීතයේ සහ වර්තමානයේ)<br>* පුරාවෘත්ත කථාව විස්තර කිරීම.<br>* පුද ලබන දෙවිවරු යකුන් පිළිබඳ විස්තර කරදීම.<br>* ශාන්තිකර්මයේ අන්තර්ගත චාරත්‍ර විදි, නර්තන ගායන වාදන, රංග භාණ්ඩ හා සැරසිලි පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.<br>ශාන්තිකර්මයක් පැවැත්වීමේදී ඒ තුල සාමුහිකත්වයෙන් කටයුතු කරන බව අවබෝධ කරවීම.<br>ශාන්තිකර්ම තුළ පවතින ගායන සහ දෙබස් ළමුන්ට ඇසෙන්නට සැලසුම් කරදීම.<br>ඇගයීම | 02<br>පැය 01 වි. 20<br><br>01 | සැප්. 03 සතිය<br>සැප්. 04 සතිය<br><br>සැප්. 04 සතිය |
| **05** | 5.0 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යනය කරමින් ජාතික උරුමය රැකගැනීම සඳහා ක්‍රියා කරයි. | 5.3 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි තොරතුරු ඉදිරිපත් කරයි. | 5.2 ශාන්තිකර්ම හඳුනා ගනිමු.<br>* පෙර දින උගත් පාඩම නැවත මතක් කිරීම.<br>* ප්‍රජා විදි රටාවේ විශේෂ අවස්ථා සඳහා ළමුන්ට රංගනයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම.<br>* ඒ ඒ ඉදිරිපත් කිරීම් හා අවස්ථා සාකච්ඡා කිරීම.<br>* වාචික ප්‍රශ්න ඇගයීම | 02<br>පැය 01 වි. 20<br><br>01<br>වි. 40 | සැප්. 04 සතිය<br>සැප්. 05 සතිය<br><br>සැප්. 05 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **06** | 5.0 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යනය කරමින් ජාතික උරුමය රැකගැනීම සඳහා ක්‍රියා කරයි. | 5.3 ශ්‍රී ලංකේය නර්තන සම්ප්‍රදාය ප්‍රවර්ධනයට දායක වුවන් අගයමින් තොරතුරු ඉදිරිපත් කරයි. | 5.3 නර්තන කලාවේ ප්‍රවර්ධනයට දායක වූ නර්තන ශිල්පීන් අගයමු. (අරනෝලිස් ඉඹුල්ගොඩ මහතා විල්සන් බලබොඩුව මහතා)<br>* පරිගණකය ඇසුරින් මෙම ශිල්පීන්ගේ ඡායාරූප ප්‍රදර්ශනය කිරීම.<br>* ශිල්පීන්ගේ නම් හා සම්ප්‍රදායන් ඒ ඇසුරින් විමසීම.<br>* සිසුන් කණ්ඩායම් කර තොරතුරු රැස් කිරීමට යොමු කිරීම.<br>* සිසුන් රැස් කළ තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම.<br>* ගුරුවරයා විසින් සාරාංශ කිරීම.<br>* කාර්ය පත්‍රිකාව ලබාදීම. පිළිතුරු ලබා ගැනීම. | 02<br>පැය 01 වි. 40 | සැප්. 05 සතිය<br>ඔක්. 01 සතිය |
| **07** | 6.0 රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්‍ෂණ විචාරයට ලක් කරයි. | 6.1 වෙනත් සංස්කෘතියකට අයත් නර්තන සම්ප්‍රදායන් අධ්‍යයනය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි. | 6.1 කථක් නර්තනයේ තොරතුරු රැස් කරමු.<br>* CD පටය (කථක්) නැරඹීමට අවස්ථාව ලබාදීම.<br>* කථක් නර්තන සම්ප්‍රදාය පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවීම.<br>* ආගමික පසුබිම විස්තර කිරීම.<br>* සංගීත සම්ප්‍රාය හා වාද්‍ය භාණ්ඩ නම් කිරීම.<br>* නර්තනය උගන්වන ආයතනය පිළිබඳව අවබෝධය ලබාදීම.<br>* උගත් තොරතුරු සාකච්ඡා කිරීම. | 01<br>වි. 40<br><br>02<br>පැය 01 වි. 40 | ඔක්. 01 සතිය<br>ඔක්. 02 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **08** | රසඥතා වර්ධනය සඳහා විවිධ තලාංග වල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි. | 6.2 වෙනත් සංස්කෘතිවලට අයත් නර්තන අංගවල සුවිශේෂ ලක්ෂණ ඉදිරිපත් කරයි. | 6.1 කථක් නර්තනයේ තොරතුරු රැස් කරමු.<br>* පෙරදිග තොරතුරු නැවත මතකයට ගැනීම.<br>* ආගමික භක්තිය හා බැඳුණු නර්තන අංගයක් බව විස්තර කරයි.<br>* රාමායනය, මහා භාරතය, කථා මුලික කොටගෙන ප්‍රචලිත වූ නර්තන අංගයක් බව පැහැදිලි කරදීම.<br>* නූතන ගණන් හා පිළිඳව විස්තර කිරීම.<br>* රාධා ක්‍රිෂ්ණා ඇඳුම් කට්ට CD මඟින් පෙන්වමින් විස්තර කිරීම.<br>ප්‍රශ්නාවලියට පිළිතුරු සැපයීම. | 01<br><br>01 | ඔක්. 02 සතිය<br><br>ඔක්. 02 සතිය |
| **09** | 6.0 රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි. | 6.2 දේශීය නාට්‍ය ශෛලින් අගයමින් තොරතුරු ඉදිරිපත් කරයි. | 6.3 දේශීය නාට්‍ය වර්ග ඉගෙන ගනිමු.<br>* නාට්‍ය අවස්ථා කිහිපයක CD පට හෝ ජායා රූප ප්‍රදර්ශනය කිරීම.<br>* අනුකරණයෙන් සාකච්ඡා කිරීම.<br>* දේශීය නාට්‍ය පිළිබඳ හැඳින්වීම.<br>* භරතමුණිගේ නාට්‍ය වර්ගීකරණය පිළිබඳ දැනුවත් කිරීම.<br>නාට්‍ය වර්ග එකින් එක විස්තර කිරීම.<br>මුද්‍රා නාට්‍යපිළිබඳ සාකච්ඡා කිරීම.<br><br>කෙටි ප්‍රශ්නාවලියකට පිළිතුරු ලබාදීම. | 01<br>වි. 40<br><br>01<br>වි. 40 | ඔක්. 03 සතිය<br><br>ඔක්. 03 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **10** | 7.0 විවිධ අත් දැකීම් ඇසුරු කරගනිමින් කලාංග නිර්මාණය කරයි. | 7.1 නිර්දේශිත ගීතයකට සවන් දී එහි සුවිශේෂතා සාකච්ඡා කරමින් අදහස් ඉදිරිපත් කරයි. | 7.1 රන්වන් දුල් කරලින් / අක්කේ අක්කේ අර බලන්නකෝ<br>* ගීතය ශ්‍රවණයට සලස්වා පාඩමට කිරීමට සැලැස්වීම.<br>* එහි පද රචනය සංගීතය සඳහා දායක වූ ශිල්පීන් හඳුන්වාදීම.<br>* ගීතය ශ්‍රවණයට සලස්වා එම ගීතය රස විඳීමට අවස්ථාව ලබාදීම.<br>* ගීතයේ භාෂාව එමෙන්ම භාවාත්මක හා ලයාන්විත වෙනස්කම් සාකච්ඡා කිරීම.<br>* ගීතය අසමින් ගායනයට යොමු කිරීම.<br>අභ්‍යාසය | 02<br>පැය 01 වි. 20<br><br>01<br>වි. 40 | ඔක්. 02 සතිය<br>ඔක්. 03 සතිය<br>ඔක්. 04 සතිය<br><br>ඔක්. 04 සතිය |
| **11** | 7.0 විවිධ අත්දැකීම් ඇසුරු කර ගනිමින් තලාංග නිර්මාණය කරයි. | 7.2 ගීතයකට අනුව නර්තන නිර්මාණය කරයි. | 7.2 ගීතය අනුව නර්තන නිර්මාණය කරමු.<br>* ගීතය ශ්‍රවණයට සැලැස්වීම.<br>* එම ගීතයට ගැලපෙන චලන වර්ගය ළමුන් මගින් අසා දැනගැනීම.<br>* සිසුන් කණ්ඩායම් කර නිර්මාණයට චලන සකස් කිරීමට අවකාශය ලබාදීම.<br>* කණ්ඩායම් ලෙස ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම.<br>* අලංකාරයට රංග රටා තවදුරටත් එක් කිරීමට උපදෙස් දීම හා අගය කිරීම.<br>ඇගයීම | 02<br>පැය 01 වි. 40<br><br>01<br>පැය 01 වි. 20<br><br>01<br><br>01<br>වි. 40 | ඔක්. 04 සතිය<br><br>නො. 01 සතිය<br><br>නො. 01 සතිය<br><br>නො. 01 සතිය |
| | | III වාරය සඳහා | ප්‍රායෝගික පරීක්ෂණය<br>ලිඛිත පරීක්ෂණය | | නො. 02 - 03 සතිය |

# දියමන්ති ව්‍යාපෘතියට අදාළ සමාජීය විද්‍යා විෂයයන් වල අධ්‍යයන ඉලක්ක.
## (සබරගමු පළාතේ සියලු පාසල් සඳහා)

**දෙවන අදියර**

**09 ශ්‍රේණිය**

**පළමු වාරය - නර්තනය**

| අනු අංක | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් හා තක්සේරුකරණය ආකෘති / ප්‍රශ්න පත්‍ර |
|---|---|---|---|---|---|---|
| **01** | පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණය කරයි. | "ශෝකය" නැමති ස්ථායි භාවය නිරූපණය කරමු. | කණ්ඩායම් ක්‍රමය | අන්තර්ජාලය උපයෝගී කොට ගනිමින් අදාළ භාවය ප්‍රකාශනය වන අවස්ථාවන් නිරීක්ෂණය යොමු කිරීම. | ශෝකය නැමති ස්ථායි භාවය ප්‍රකාශ කිරීමට සුදුසු සිද්ධියක් භාව ප්‍රකාශනය වන පරිදි සුදුසු චලන යොදා නිරූපණය කරන්න. | සිසුන් ප්‍රායෝගිකව භාව ප්‍රකාශනය වන පරිදි ඉදිරිපත් කරන සිද්ධියට එක් එක් සිසුවා වෙනුවෙන් නිර්ණායක මූලිකව ඇගයීමකට ලක් කරමින් ලකුණු ලබාදීම. |
| **02** | පරිසරය නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණය කරයි. | පන් නෙලීම / ගොයම් කැපීමේ නැටුමක් නිර්මාණය කරමු. | කණ්ඩායම් ක්‍රමය | අන්තර් ජාලය හෝ පටිගත කරන ලද CD / DVD පටි උපයෝගී කොට ගනිමින් පන් නෙලීම / ගොයම් නැටුමක් නිරීක්ෂණයට යොමු කිරීම. | කණ්ඩායමක් වශයෙන් එක් වී සුදුසු චලන යොදා ගනිමින් හා උපකරණ භාවිත කරමින් පන් නෙලීමේ නැටුමක් / ගොයම් කැපීමේ නැටුමක් නිර්මාණය කරන්න. | සිසුන් විසින් ප්‍රායෝගිකව ඉදිරිපත් කරනු ලබන පන් නෙලීමේ / ගොයම් කැපීමේ නැටුමට එක් එක් සිසුවා වෙනුවෙන් නිර්ණායක මූලිකව ඇගයීමට ලක් කරමින් ලකුණු ලබාදීම. |

| අනු අංක | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් |
|---|---|---|---|---|---|---|
| **03** | නර්තනය හා සබැඳි මූල ධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | ගොඩ සරඹ / ඉලංගම් සරඹ / දොඹින පද අභ්‍යාසයෙන් සම්ප්‍රදායක නර්තනයට හස්ත පාද හුරු කරගනිමු. | පියවර ක්‍රමය, ප්‍රායෝගික අනුකරණ ක්‍රමය | ජාතික අධ්‍යාපන ආයතනය නිකුත් කර ඇති ගොඩ සරඹ ඉලංගම් සරඹ / දොඹින පද ඇතුළත් CD තැටි නිරීක්ෂණයට යොමු කිරීම. | ගොඩ සරඹ / ඉලංගම් සරඹ / දොඹින පද යොදාගනිමින් පෙර ශ්‍රේණිවලදී උගත් වන්නමකට නර්තනයක් නිර්මාණය කරන්න. | ප්‍රායෝගිකව ගොඩ සරඹ / ඉලංගම් සරඹ / දොඹින පද නර්තනය කිරීමට අවස්ථාව ලබාදීම. නිර්ණායක මුලිකව ඇගයීම සිදුකර ලකුණු ලබාදීම. |
| **04** | නර්තනය හා බැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | අලංකාර පද නිර්මාණය මගින් රස විඳිමු. | කණ්ඩායම් ක්‍රමය | අන්තර්ජාලය භාවිතයෙන් අලංකාර පද යොදා නිර්මාණ කළ නර්තනයක් නිරීක්ෂණයට යොමු කිරීම. | සතර බීජාක්ෂර සරඹ පද හා මැදුම් තනිතිත අයත් බෙර පද යොදා ගනිමින් නිර්මාණාත්මක බෙර වාදන අංගයක් නිර්මාණය කරන්න. | ප්‍රායෝගිකව සිසුන් බෙර වාදන අවස්ථාවක් ඉදිරිපත් කිරීමට සලස්වා නිර්ණායක මුලිකව ඇගයීමට ලක්කර ලකුණු ලබා දෙන්න. |
| **05** | ශ්‍රී ලාංකීය සංස්කෘතිය හා සබැඳි ගායනාවල පසුබිම අධ්‍යයනය කරයි. | සතර බීජාක්ෂර මුල් කර ගනිමින් සරඹ පද වාදනය සහ මැදුම් තනිතිතට අයත් බෙර පද වාදනය | අනුකරණ ක්‍රමය, කණ්ඩායම් ක්‍රමය | අන්තර් ජාලය භාවිතයෙන් හෝ CD / DVD තැටි භාවිතයෙන් සමූහ වාදන අවස්ථාවක් නිරීක්ෂණයට යොමු කිරීම. | සතර බීජාක්ෂර, සරඹ පද හා මැදුම් තනි තිතේ බෙර පද යොදා ගනිමින් නිර්මාණාත්මක බෙර වාදන අංගයක් නිර්මාණය කරන්න. | ප්‍රායෝගිකව සිසුන් බෙර වාදන අවස්ථාවක් ඉදිරිපත් කිරීමට සලස්වා නිර්ණායක මුලිකව ඇගයීමට ලක්කර ලකුණු ලබා දෙන්න. |
| **06** | ශ්‍රී ලාංකීය සංස්කෘතිය හා සබැඳි ගායනාවල පසුබිම අධ්‍යයනය කරයි. | කඩතුරා, පන්නෙලීම, ගොයම්, සොකරි, සිංහරාජ / විරාඩි අනුරාග දණ්ඩ තාලය | පියවර ක්‍රමය, අනුකරණ ක්‍රමය | අන්තර් ජාලය භාවිතයෙන් අදාළ ගායනා ඇතුළත් ශ්‍රව්‍ය හෝ දෘශ්‍ය CD / DVD තැටි ප්‍රායෝගිකව පහත රට නර්තනය. I, II ජයසේන කෝට්ටෙගොඩ මයා | අදාළ ගායනා ඉදිරිපත් කරමින් ඒ සඳහා සුදුසු සරල අංග චලන යොදා ගනිමින් ගායනාංගයක් නිර්මාණය කරන්න. | සිසුන්ට ප්‍රායෝගිකව ගායනය ඉදිරිපත් කිරීමට සලස්වා නිර්ණායක මුලිකව ඇගයීමට ලකුණු පැවරීම. |

# දියමන්ති ව්‍යාපෘතියට අදාළ සමාජීය විද්‍යා විෂයයන් වල අධ්‍යයන ඉලක්ක.

## (සබරගමු පළාතේ සියලු පාසල් සඳහා)

**දෙවන අදියර**

**09 ශ්‍රේණිය**

**දෙවන වාරය - නර්තනය**

| අනු අංක | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් |
|---|---|---|---|---|---|---|
| **01** | පරිසර නිරීක්ෂණයෙන් ලැබෙන අත් දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණ කරයි. | නර්තන මාධ්‍යයෙන් මිනිස් චරිත නිරූපණය කරමු. | පියවර ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය, කණ්ඩායම් ක්‍රමය | අන්තර් ජාලය හෝ CD / DVD තැටි උපයෝගී කරගනිමින් ධීවරයා, කුඹල්කර, ගොවියා, තේ දළු නෙලන්නී යන චරිතයන්ගේ ස්වභාවය අධ්‍යයනය කිරීමට අවස්ථාව සැලසීම. | තෝරාගත් එක් චරිතයක් වටා ගෙතෙන කිසියම් අවස්ථාවක් හෝ සිද්ධියක් තාල රිද්ම අනුගමනය කරමින් සුදුසු චලන යොදා නිර්මාණය කරන්න. | අදාළ චරිත නිරූපණය සිසුන්ට ප්‍රායෝගිකව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදී නිර්නායක මුලිකව ඇගයීමට ලක්කර ලකුණු පිරිනැමීම. |
| **02** | නර්තනය හා සබැදි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | නර්තනය සඳහා පාද හුරු කර ගනිමු. | පියවර ක්‍රමය | ජාතික අධ්‍යාපන ආයතන නිකුත් කර ඇති පා සරඹයට /දණ්ඩිය සරඹ / මණ්ඩි පද ඇතුලත් CD තැටිය නිරීක්ෂණයට යොමු | සිසුන් උගත් පා සරඹ ඇසුරින් ලී කෙලි කවියක් සඳහා සුදුසු නර්තනයක් නිර්මාණය කරන්න. | සිසුන්ට ප්‍රායෝගිකව පා සරඹ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදී නිර්ණායක මුලිකව ඇගයීම සිදුකර ලකුණු පැවරීම. |

| අනු අංක | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් |
|---|---|---|---|---|---|---|
| 03 | නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | අලංකාර පද නිර්මාණය මගින් රස විඳිමු. | පියවර ක්‍රමය, කණ්ඩායම් ක්‍රමය | අන්තර් ජාලය භාවිතයෙන් හෝ CD/ DVD තැටි භාවිතයෙන් අලංකාර පද යොදා නිර්මාණ කළ නර්තනයක් නිරීක්ෂණයට යොමු කිරීම. | සිසුන් නිර්මාණකරණය අලංකාර පද ගීතයකට යොදා නර්තනයක් නිර්මාණය කිරීම. | ප්‍රායෝගික ක්‍රියාකාරකමක් ඇසුරින් සිසුන් ඉදිරිපත් කරනු ලබන අලංකාර පද සඳහා නිර්ණායක මූලිකව ඇගයීමට ලක්කර ලකුණු පිරිනැමීම. |
| **04** | සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනා ගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි. | ගැටබෙරය හා එහි වාදන අවස්ථා පිළිබඳ තොරතුරු විමසමු. | කණ්ඩායම් ක්‍රමය, පියවර ක්‍රමය | ගැටබෙරයේ ව්‍යුහය පිළිබඳ තොරතුරු ඇතුළත් CD/ DVD තැටියක් නිරීක්ෂණය කිරීමට යොමු කිරීම. (උඩරට බෙර වාදන කලාව - කරුණාරත්න බණ්ඩාර) | ගැටබෙරය සෑදීමට ගන්නා අමුද්‍රව්‍ය සැකැස්ම හා ව්‍යුහය බෙරයේ කොටස් නම් කිරීම රූප සටහන, ගැට බෙරය වාදන අවස්ථා ඇතුළත් කාර්ය පත්‍රිකාවක් ලබා දී එය සම්පූර්ණ කිරීම. | ගැටබෙරය පිළිබඳ සකස් කරගත් ප්‍රශ්නාවලියක් මගින් ලිඛිතව / වාචිකව පිළිතුරු ලබාගෙන ඇගයීමට ලක්කෙරේ. |
| **05** | සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනා ගනිමින් වාද්‍ය කුසලතා ප්‍රදර්ශනය කරයි. | පංචතූර්ය වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු රැස් කරමු. | කණ්ඩායම් ක්‍රමය | අන්තර් ජාලය හෝ CD / DVD මගින් සමූහ වාදන අවස්ථාවක් ශ්‍රවණය කිරීමට හෝ නැරඹීමට සැලැස්වීම. | පිටු පෙරළනයක් සෑදීම මගින් පංචතූර්ය වාද්‍ය භාණ්ඩ නම් කිරීම හා විස්තර කරන්න. | පංචතූර්ය වාද්‍ය භාණ්ඩ පිළිබඳ සකස් කළ ලිඛිත / වාචික ප්‍රශ්නාවලියක් මගින් පිළිතුරු ලබාගෙන ඇගයීමට ලක් කිරීම. |

| අනු අංක | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් |
|---|---|---|---|---|---|---|
| **06** | ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයන කර මින් ජාතික උරුමය රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | ශ්‍රී ලාංකේය නර්තන කලාව හා සම්බන්ධ මූලාශ්‍රය හඳුනා ගනිමු. (සෙල්ලිපි, සංදේශ කාව්‍ය) | කණ්ඩායම් ක්‍රමය පැවරුම් ක්‍රමය | සිංහල නර්තන කලාව මුදියන්සේ දිසානායක තිසර - සැළලිහිනි පරෙවි, සංදේශ කාව්‍ය | සෙල්ලිපි හා සංදේශ කාව්‍ය ඇසුරින් යුගය මූලාශ්‍ර සාධක නිගමනය දැක්වෙන කාර්ය පත්‍රිකාවක් සම්පූර්ණ කිරීම හෝ සකස් කිරීම | සෙල්ලිපි හා සංදේශ කාව්‍ය මගින් නර්තන කලාව පිළිබඳ සඳහන් තොරතුර ඇසුරින් ප්‍රශ්නාවලිය ලිඛිතව / වාචිකව ලබාගෙන ඇගයීමට ලක් කිරීම. |
| **07** | ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රධායන් හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයන කර මින් ජාතික උරුමය රැකගැනීම සඳහා ක්‍රියා කරයි. | ශාන්තිකර්ම හඳුනා ගනිමු. | කණ්ඩායම් ක්‍රමය | කොහොඹා කංකාරිය දෙවොල්මඩුව / පහන් මඩුව ශාන්තිකර්මයේ කොටසක් අන්තර් ජාලය හෝ CD /DVD තැටි මගින් ප්‍රදර්ශනය කර එය නිරීක්ෂණයට යොමු කිරීම. "සිංහල නර්තන කලාව " මුදියන්සේ දිසානායක" | කොහොඹා කංකාරිය / දෙවොල් මඩුව / පහන් මඩුව ශාන්තිකර්මයන් පිළිබඳ පැවැත්වීමේ හේතු පුරාවෘත්ත කතාව, පුද ලබන දෙවිවරු, යකුන්, චාරිත්‍ර විධි, නර්තන ගායන වාදන, රංග වස්ත්‍රාභරණ, රංගභාව ඇතුළත් පිටු පෙරලනයක් සකස් කිරීම. | අදාළ ශාන්තිකර්මය පිළිබඳ ප්‍රශ්නාවලියක් ලබාදී ලිඛිතව / වාචිකව පිළිතුරු ලබාගෙන සිසුන් ඇගයීමට ලක්කිරීම. |
| **08** | ශ්‍රී ලාංකේය නර්තන සංස්කෘතිය හා සබැඳි පසුබිම අධ්‍යයනය කරයි. | කඩතුරා කවි / පන් නෙළීම / ගොයම් /සොකරි / සිංහරාජ / වි...... | කණ්ඩායම් ක්‍රමය අනුකරණ ක්‍රමය | අන්තර් ජාලය භාවිතයෙන් අදාළ ගායනා ඇතුළත් ශ්‍රව්‍ය හෝ දෘශ්‍ය CD / DVD තැටි ප්‍රායෝගික පහතරට නර්තනය – I, II ජයසේන කෝට්ටගොඩ | අදාළ ගායන ඉදිරිපත් කරමින් ඒ සඳහා සුදුසු සරල අංග චලන යොදාගනිමින් ගායනාංගයක් නිර්මාණය කරන්න. | සිසුන්ට ප්‍රායෝගිකව ගායනය ඉදිරිපත් කිරීමට සලස්වා නිර්ණායක මුලිකව ඇගයීම ලක්කර ලකුණු පැවරීම. |

# දියමන්ති ව්‍යාපෘතියට අදාළ සමාජීය විද්‍යා විෂයයන් වල අධ්‍යයන ඉලක්ක.
## (සබරගමු පළාතේ සියලු පාසල් සඳහා)

**දෙවන අදියර**
**09 ශ්‍රේණිය**

**තුන්වන වාරය - නර්තනය**

| අනු අංක | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් |
|---|---|---|---|---|---|---|
| **01** | නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | ගොඩ සරඹ / ඉලංගම් සරඹ / දොඹින පද අභ්‍යාසයෙන් සම්පූර්ණ නර්තනයට හස්ත පාද හුරුකර ගනිමු. | පියවර ක්‍රමය<br>ප්‍රායෝගික ක්‍රමය<br>අනුකරණ ක්‍රමය | ජාතික අධ්‍යාපන ආයතනයෙන් නිකුත් කර ඇති ගොඩසරඹ ඉලංගම් සරඹ / දොඹින පද / ඇතුළත් CD තැටිය නිරීක්ෂණයට යොමු කිරීම.<br>නර්තනය අතිරේක කියවීම පොත (9) | ගොඩ සරඹ / ඉලංගම් ගොඩ සරඹ / දොඹින පද යොදා ගනිමින් පෙර ශ්‍රේණිවලදී උගත් වන්නමකට නර්තනයක් නිර්මාණය කරන්න. | ප්‍රායෝගික ගොඩසරඹ ඉලංගම් සරඹ / දොඹින පද නර්තනයට යොමු කර නිර්නායක මූලික ඇගයීම් සිදුකර ලකුණු ලබාදීම. |
| **02** | නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | අලංකාර පද<br>වන්නම් කවි<br>ප්‍රස්තාර කරමු | කණ්ඩායම් ක්‍රමය<br>පැවරුම් ක්‍රමය | අන්තර් ජාලය හෝ CD / DVD තැටි භාවිතයෙන් අලංකාර පද යොදා නිර්මාණය කල නර්තනයක් නිරීක්ෂණයට යොමු කිරීම | නිර්මාණය කරන අලංකාර පද ගීතයකට යොදා නර්තනයක් නිර්මාණය කිරීම. | ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් සිසුන් ඉදිරිපත් කරනු ලබන අලංකාර පද සඳහා නිර්මාණ මූලිකව ඇගයීමකට ලක් කර ලකුණු ලබා දීම. |

| අනු අංක | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් |
|---|---|---|---|---|---|---|
| **03** | නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | බෙර පද වන්නම් කවි ප්‍රස්තාර කරමු | කණ්ඩායම් ක්‍රමය පැවරුම් ක්‍රමය | ජාතික අධ්‍යාපන ආයතනය මගින් ප්‍රකාශයට පත්කර ඇති නර්තනය අතිරේක කියවීම් පොත "9 ශ්‍රේණිය" | කණ්ඩායමක් වශයෙන් එකතු වී මාත්‍රා 3 තාලයට, කස්තිරම්, සීරුමාරු, අඩව්, ක...... හා මාත්‍ර 3 + 4 තාලයට බෙරපද කවිපද හා වන්නම් කඩතුරා කවි පන්නෙලීම ගොයම් සොකරි කවි ඇතුළත් පොතක් සකස් කරන්න. | අදාළ බෙරපද කවිපද අඩව්, කස්තිරම්, සීරුමාරු, ඉරට්ටි සිසුන්ට ප්‍රස්තාර කිරීමට ලබාදී ලිඛිතව ඇගයීමට ලක්කිරීම. |
| **04** | ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනාවල පසුබිම අධ්‍යයනය කරයි. | කඩතුරා කවි, පන්නෙලීම, ගොයම්, සොකරි නියමිත වන්නම් වල සංස්කෘතික පසුබිම හා ගායනා වල සුවිශේෂි ලක්‍ෂණ | අනුකරණ ක්‍රමය / පියවර ක්‍රමය | ජාතික අධ්‍යාපන ආයතනය මගින් ප්‍රකාශයට පත්කර ඇති නර්තනය අතිරේක කියවීම් පොත "9 ශ්‍රේණිය" | එක් එක් කවි ගායනයේ සංස්කෘතික පසුබිම භාෂාව නාදමාලා හා තාල රූප සුවිශේෂ ලක්‍ෂණ ඇතුලත් කාර්ය පත්‍රිකාවක් සම්පූර්ණ කිරීම. | අදාල කවි ගායනා පිළිබඳ සැකසු ප්‍රශ්ණාවලියක් මගින් ලිඛිතව / වාචිකව පිළිතුරු ලබාගනී. |
| **05** | රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්‍ෂණ විචාරයට ලක් කරයි. | කථක් නර්තනයේ තොරතුරු රැස් කරමු. | කණ්ඩායම් ක්‍රමය | කථක් නර්තන අංගයක් ඇතුළත් CD/ DVD තැටි භාරතීය සම්භාව්‍ය නර්තන කලාප ජයසේන කෝට්ටගොඩ මහතා | කථක් නර්තන සම්ප්‍රදාය ආගමික පසුබිම ප්‍රචලිත ප්‍රදේශ, සංගීතය, වාද්‍ය භාණ්ඩ, නර්තනය, රංග වස්ත්‍රාභරණ, ඇතුළත් කරමින් හැකුළුම් පතක් නිර්මාණය කරන්න. | කථක් නර්තන සම්ප්‍රදාය පිළිබඳ සැකසූ ප්‍රශ්නාවලියක් මගින් ලිඛිතව / වාචිකව පිළිතුරු ලබාගෙන ඇගයීමට ලක් කිරීම |

| අනු අංක | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් |
|---|---|---|---|---|---|---|
| **06** | රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංග වල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි. | දේශීය නාට්‍ය වර්ග ඉගෙන ගනිමු. | කණ්ඩායම් ක්‍රමය පැවරුම් ක්‍රමය | තාත්වික / ශෛලීය ගීත නාට්‍ය ඇතුළත් CD / DVD පටි නිරීක්ෂණය යොමු කිරීම.<br>ජාතික අධ්‍යාපන ආයතනය ප්‍රකාශනයට පත්කර ඇති නර්තනය<br>අතිරේක කියවීම් පොත<br>9 ශ්‍රේණිය | එක් එක් නාට්‍ය වර්ග පිළිබඳ තොරතුරු ඇතුළත් කොට පින්තූර සහිත පොත් පිංචක් සැකසීම. | අදාළ නාට්‍ය ශෛලීන් පිළිබඳ තොරතුරු රැස් කිරීමට සලස්වා නිර්ණායක මුලිකව ඇගයීම සිදුකර ලකුණු පැවරීම. |
| **07** | ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා බැඳි ගායනාවල පසුබිම අධ්‍යයනය කරයි. | කඩතුරා, පන්නෙලීම, ගොයම්, සොකරි, සිංහරාජ, විරාඩි, අනුරාග, දණ්ඩ තාලය | කණ්ඩායම් ක්‍රමය අනුකරණ ක්‍රමය | අන්තර් ජාලය භාවිතයෙන් අදාළ ගායනා ඇතුළත් ශ්‍රව්‍ය දෘශ්‍ය හෝ CD/ DVD තැටි නිරීක්ෂණය සොයා කිරීම. | අදාළ ගායනය ඉදිරිපත් කරමින් ඒ සඳහා සුදුසු සරල අංග චලන යොදා ගනිමින් ගායනය නිර්මාණය කරන්න. | සිසුන්ට ප්‍රායෝගික ගායන ඉදිරිපත් කිරීමට සලස්වා නිර්ණායක මුලිකව ඇගයීමට ලක්කර ලකුණු පැවරීම. |